# නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ දාර්ශනික වැදගත්කම

මෙරට දාර්ශනිකයෙකු වන නලින් ද සිල්වා මහාචාර්යතුමන් විසින් නිර්මාණය කරන ලද නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය අපට වැදගත් වන්නේ කෙසේ ද යන්න සැකෙවින් විමසා බැලීම මේ කෙටි ලිපියේ අරමුණයි.

ජගත් අධිරාජ්‍යවාදයේ ප්‍රධාන සංරචක තුනකි. ඒ ආර්ථික, සංස්කෘතික සහ දේශපාලන යන ඒවා ය. ජගත් අධිරාජ්‍යවාදය තම උපක්‍රම සහ උපායයන් වෙනස් කර ඇති බවක් පෙනෙන අතර අද ඔවුන් ලෝකය පාලනය කරන්නේ ඔවුන් ගේ දැනුමේ ආධිපත්‍යයෙනි. ජගත් අධිරාජ්‍යවාදය පරාජය කළ හැක්කේ කතෝලික චින්තනය වැනි විජාතික චින්තන මත පදනම් වූ මාක්ස්වාදය වැනි විජාතික දැනුම් පද්ධතිවලින් නො වේ. දශක හයක පමණ කාලයක් පුරා මෙරට දේශපාලන ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන මාක්ස් ලෙනින්වාදී, මාක්ස් ට්‍රොට්ස්කිවාදී සහ මාඕවාදී පක්ෂ අද වන විට බෝඩ් ලෑලි පක්ෂ බවට පත් වී තිබීම ම ඒ බව නිහඬව කියාපායි. අද වන විට මාක්ස්වාදය ද ජගත් අධිරාජ්‍යවාදයේ පැවැත්ම සඳහා යොදා ගන්නා තවත් එක් මතවාදයක් පමණක් බව අවධාරණය කළ මහාචාර්ය නලින් ද සිල්වා විසින් එය ශ්‍රී ලාංකේය දේශපාලන ක්ෂේත්‍රය තුළ තීරණාත්මක ලෙස පරාජය කරන ලදී. මාක්ස්වාදය වැනි විජාතික මතවාදවල සරණ ගිය මෙරට තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක ගේ ජීවිත දෙවරක් ම නිකරුණේ විනාශ විය. මාක්ස්වාදය වැනි විජාතික මතවාද වෙනුවට මෙරට ජාතික චින්තනය මත පදනම් වූ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය ඉදිරිපත් කිරීම අතිශයින් ම කාලෝචිත ය. ජගත් අධිරාජ්‍යවාදයේ දේශපාලනික සහ ආර්ථික සංරචකවලට පමණක් එරෙහි වන අංශභාග මාක්ස්වාදයට විකල්පයක් ලෙස, සමස්ත අධිරාජ්‍යවාදයට ම එරෙහි වන නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය ඉදිරිපත් කිරීම වැදගත් ය. දැනටමත් එය ශ්‍රී ලාංකේය සමාජයට කර ඇති බලපෑම අතිශයින් ම තීරණාත්මක ය.

නමින් ම අවධාරණය කර ඇති පරිදි නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය දැනුම "වාස්තවික වේ" යන අදහස ප්‍රතික්ෂේප කරයි. අද බටහිරයන් ක්‍රියාත්මක වන්නේ බටහිර දැනුම ලොව ඇති එක ම වාස්තවික දැනුම ලෙස සිතමිනි. ඔවුන් ගේ මේ අධිරාජ්‍යවාදී ක්‍රියාදාමය නිසා විකල්ප දැනුම් පද්ධතිවලට ඉඩක් නැති ව යයි. වෙනත් ආකාරයකින් කියන්නේ නම් ඒවා විනාශ කිරීමට ඔවුහු කටයුතු කරති.

දැනුම, මනසට ඉන්ද්‍රිය පද්ධතියට සහ සංස්කෘතියට සාපේක්ෂ බව අවධාරණය කෙරෙන නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය අනෙකුත් විකල්ප දැනුම් පද්ධතීන් ගේ පැවැත්ම ද තහවුරු කරයි. එපමණක් ද නො ව ජගත් අධිරාජ්‍යවාදය පරාජය කර දේශයට විමුක්තිය ලබාගැනීමේ මාවත වැටී ඇත්තේ ද නිර්මාණාත්මක සාපේක්ෂතා-වාදය හරහා වීම ද වැදගත් ය.

මෙරට ජාතික චින්තනයේ ඇති වැදගත් ලක්ෂණ පමණක් නො ව දුර්වලතා ද නලින් ද සිල්වා මහාචාර්යතුමා ගේ නිරීක්ෂණයට ලක් වී තිබීම වැදගත් ය. සිංහල බෞද්ධ චින්තනය යනු සංයුක්ත චින්තනයකි. එහෙත් නව දැනුම් නිර්මාණය කිරීමේ දී යම් ආකාරයකට වියුක්ත ව සිතීමක් අවශ්‍ය බව ඔහු පෙන්වා දී ඇත. අනුරාධපුර යුගයේ මුල් භාගයේ දී පමණ සිංහලයින් යම් මට්ටමකට වියුක්ත ව සිතමින් දැනුම් නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම අභිධර්මය වැනි අධ්‍යයන වියුක්ත චින්තනයත් සමඟ බැඳී පවතී.

බුදුරජාණන් වහන්සේ ද ඇතුළත් වූ අනාර්ය ශ්‍රමණ සම්ප්‍රදාය භාරත භූමියෙන් තුරන් වී ඇත. ඊට හේතු වී ඇත්තේ අනාර්ය ශ්‍රමණ සම්ප්‍රදාය අභිබවා ආර්ය බ්‍රාහ්මණ සම්ප්‍රදායේ ආධිපත්‍යය පැතිරීමයි. අනාර්ය ශ්‍රමණ සම්ප්‍රදාය භාරත දේශය තුළ පරාජයට පත් වූයේ ඇයි ද යන්න මහාචාර්ය නලින් ද සිල්වා ගේ නිරීක්ෂණයට ලක් වී ඇත. ඒ මහතා පවසන පරිදි ඊට හේතු වී ඇත්තේ වියුක්ත චින්තනයට බර ආර්යයන් ලෞකික ක්ෂේත්‍රය තුළ නව දැනුම් නිර්මාණය කිරීමත්, සංයුක්ත චින්තනයක් තිබූ අනාර්යයන් එසේ නො කිරීමත් ය. අනාර්ය චින්තනය තුළ ලෞකික නො වන එනම් වටිනා ආධ්‍යාත්මික දැනුමක් ඇත. බුදු දහම හරහා එය සිංහලයන්ට ද ලැබී ඇත. මේ අනුව සිංහල බෞද්ධ චින්තනය ද අනාර්ය ශ්‍රමණ චින්තනය මෙන් ම සංයුක්ත චින්තනයකි.

එහෙත් ප්‍රශ්නය වන්නේ ජගත් අධිරාජ්‍යවාදීන් අතිශයින් ම වියුක්තයට බර චින්තනයක් වූ බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය මත පදනම් ව ලෞකික දැනුම් සුවිශාල වශයෙන් නිර්මාණය කිරීමයි. එබැවින් අධිරාජ්‍යවාදයට එරෙහි ව කෙරෙන අරගලයේ දී සංයුක්ත චින්තනයක් වූ සිංහල බෞද්ධ චින්තනයට යම් පමණකට හෝ වියුක්ත ලක්‍ෂණ එක් කර ගෙන දැනුම නිර්මාණය කිරීමට සිදු වන බව අවධාරණය කර තිබීම වැදගත් ය. මෙහි කිසියම් ආකාරයක අනතුරු ඇඟවීමක් ද කෙරී ඇත. එනම් අප සතු වටිනා ආධ්‍යාත්මික උරුමයට අමතරව ලෞකික ක්ෂේත්‍රයේ දැනුම නිර්මාණය කරමින් ජගත් ආධිරාජ්‍යවාදයට එරෙහි නො වුණ හොත් භාරතයේ දී අනාර්ය ශ්‍රමණ සම්ප්‍රදායට සිදු වූවාක් මෙන් අපට ද පරාජය වීමට සිදු වන බවය.

නිර්මාණාත්මක සාපේක්‍ෂතාවාදය සිංහල බෞද්ධ පදනමක් මත නිර්මාණය කෙරී ඇති හෙයින් එහි ඥාන විභාගයීය ස්ථාවරය බුද්ධිවාදී හෝ අනුභූතිවාදී එකක් නො වේ. තව ද එහි සත්භාවවේදී ස්ථාවරය භෞතිකවාදී හෝ විඥානවාදී නො වේ. (වැඩි විස්තර සඳහා "නිර්මාණාත්මක සාපේක්‍ෂතාවාදය ගැන හැඳින්වීමක්" කෘතිය කියවන්න). මේ අනුව නිර්මාණාත්මක සාපේක්‍ෂතා-වාදයට ඊට ම ආවේණික දාර්ශනික ස්ථාවරයක් තිබීම ද මෙරට වැසියන් ගේ අභිමානයට කරුණකි.

නිර්මාණාත්මක සාපේක්‍ෂතාවාදය මඟින් බටහිර හෝ බාහිර හෝ සියලු දේ ප්‍රතික්ෂේප කෙරෙයි යන මතය ඉතා ම වැරැදි එකකි. මක්නිසා ද වෙනත් සංකල්පයක් හෝ මතවාදයක් හෝ වුවත් අපට ගැලපෙන ලෙස සකස් කර ගැනීම (අවශෝෂණය කර ගැනීම) ද නිර්මාණයක් ලෙස සැලකෙන හෙයිනි. මේ අනුව බලන විට පැහැදිලි වන්නේ නලින් ද සිල්වා මහාචාර්යතුමා විසින් ජාතික දුර්වලතා, අප සකස් කරගත යුතු තැන්, වටිනා නිරීක්‍ෂණ පදනම් කරගෙන නිර්මාණාත්මක සාපේක්‍ෂතාවාදය නිර්මාණය කෙරී ඇති බවයි. වඩාත් ම වැදගත් කාරණය වන්නේ බුදු දහමෙන් අපට පෙන්වා දෙන මෙලොව ජීවිතය (ලෞකික ජීවිතය) සහ පරලොව ජීවිතය යහපත් කරගෙන නිවන් අවබෝධ කිරීම යන අරමුණු සාක්‍ෂාත් කිරීමට බාධා නො වන පරිදි නිර්මාණාත්මක සාපේක්‍ෂතාවාදය ඉදිරිපත් කර තිබීම ය.

*පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ*
*දර්ශන හා මනෝ විද්‍යා දෙපාර්තමේන්තුවේ කථිකාචාර්ය*
**සුමේධ වීරවර්ධන**